" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

132

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05(A) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.09.15 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ ලිපි අංක : 01/2021

ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්,ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

<u>ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනා ඉල්ලීම් ඉදිරිපත් කිරීම</u>

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත බලය අභිනියෝජන බලධාරියා මගින් අභියාචනා යොමු නොකොට සෘජුවම එම ඉල්ලීම් හා අභියාචනා යොමු කරන බව ආණ්ඩුකාර ලේකම් විසින් ඔබටද පිටපත් සහිතව මා වෙත දැනුම් දී ඇත.

02. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධව නිකුත් කර ඇති 2021.03.01 දිනැති පාලන චක්‍රලේඛ 02/2021 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

03. එම චක්‍රලේඛයේ 02 වන ඡේදය මගින් දන්වා ඇති පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පහතින් දක්වා ඇති ගැසට්පත්‍ර මගින් පවරා ඇති බලතල ප්‍රකාරව නිසි විනය බලධාරීත්වය හඳුනා ගෙන,පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කල යුතු වන්නේ බලය අභිනියෝජිත බලධරයා මගින් වන අතර එම අභියාචනයේ පිටපතක් අදාල පරිදි තම ආයතන ප්‍රධානියා,දෙපාර්තමේන්තු ප්‍රධානියා,අවස්ථාවෝචිත පරිදි අමාත්‍යාංශයේ ලේකම් වෙතද,යොමු කරන ලෙස ඔබගේ කාර්ය මණ්ඩලයේ සියළු දෙනා දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

01. 2018.03.26 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 2064/8

02. 2018.07.31 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 2082/7

03. 2019.06.14 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 2127/29

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.